# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1985 අංක 31 දරන
# හින්දු සංස්කෘතික අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1985 අගෝස්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 75 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින.]

එල්.ඩී.—ඕ. 16/83.

හින්දු සංස්කෘතික අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවීම සඳහා සහ එහි පරමාර්ථ හා බලතල නිශ්චිතව සඳහන් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "හින්දු සංස්කෘතික අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. හින්දු සංස්කෘතික අරමුදල පිහිටුවීම.

(2) අරමුදල, (1) වන උපවගන්තිය මගින් ඊට පැවරුණු නමින් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද, ඒ නමින් සංස්ථාව විසින් නඩු පවරනු ලැබීම හා සංස්ථාවට විරුද්ධව නඩු පැවරීම කළ හැකි ය.

3. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය සතු කරනු ලැබිය යුතු ය. අරමුදලේ පාලක මණ්ඩලය.

(2) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් පස් දෙනෙක්; සහ

(ආ) නිල බලයෙන් පත් කරන ලද සාමාජිකයන් තුන් දෙනෙක්, එනම්:—

(i) හින්දු කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්;

(ii) හින්දු කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ;

(iii) ද්‍රවිඩ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ.

(3) සාමාජිකයින් අතුරෙන් කෙනකු මණ්ඩලයේ සභාපති වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ සෑම සාමාජිකයකුම මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුකොටගෙන කලින් ධුරය අත්හරින්නේ නම් මිස, අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. කල්ගෙවී යාම නිසා ධුරය අත්හරින මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ යම් සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථානුකූල යයි තමා සලකන්නේ නම්, ඒ සම්බන්ධයෙන් කිසිදු හේතුවක් නොදක්වා එසේ කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම පිළිබඳව යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්, සාමාජිකයකු හෝ සභාපති වශයෙන් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වීම, කවර විටක වුවද, ඒ සඳහා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ යම් සාමාජිකයකු මිය ගියහොත් හෝ ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත්, මියගිය, ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයකු, මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ධුරය අත් හරිනු ලබන්නේ නම් මිස, ස්වකීය පූර්වගාමියාගේ ධුර කාලයෙන් ගත නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(9) රෝගාතුරවීම නිසා, වෙනත් අබලතාවයක් නිසා, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධුරයෙහි කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, සභාපතිවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(10) මණ්ඩලයේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(11) (10) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් වූ කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම විධිමත් කරනු ලැබිය හැකි ය.

(12) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් ඇතිවීමේ හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමේ දී යම් දෝෂයක් ඇතිවීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කට යුත්තක් නිර්බල නොවිය යුතු ය.

(13) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික දීමනා සහ වෙනත් වියදම් මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

(14) මණ්ඩලයේ බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධරයා

4. මණ්ඩලයේ විධානවලට යටත්ව හින්දු කටයුතු අධ්‍යක්ෂවරයා අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු ය.

5. අරමුදලේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි වන්නේ ය :— අරමුදලේ පරමාර්ථ.

(අ) හින්දු කෝවිල් සහ වෙනත් හින්දු ආගමික ආයතනවලට හෝ සංගමයන්ට, ඒවායේ ආගමික, සංස්කෘතික සහ අධ්‍යාපනික කටයුතු වැඩිදියුණු කිරීම සඳහා මුදල් හා වෙනත් ආධාර සැපයීම ;

(ආ) යම් හින්දු කෝවිලක් හෝ ඒ කෝවිලට අයත් යම් දේපළක් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර සැපයීම ;

(ඇ) හින්දු ආගමික කෘතීන් ප්‍රකාශයට පත් කිරීම සහ පරිවර්තනය කිරීම ඇතුළු හින්දු ආගම හා සම්බන්ධ අධ්‍යයන හා පර්යේෂණ සඳහා මුදල් හා වෙනත් ආධාර සැපයීම සහ එවැනි අධ්‍යයන, පර්යේෂණ, ප්‍රකාශන හා පරිවර්තන සඳහා ආයතන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම ;

(ඈ) මණ්ඩලයේ මතය අනුව, හින්දු ජනතාවට ප්‍රයෝජනයක් හෝ සම්බන්ධතාවක් ඇති වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කටයුත්තක් ප්‍රවර්ධනය කිරීමේ දී සහාය වීම.

6. (1) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමෙහිලා හේතුවන හෝ ආනුෂංගික වන හෝ ඒ සඳහා අවශ්‍ය වන සියලු ක්‍රියා කිරීම සඳහා වූ බලය මේ පනතේ සහ වෙනත් යම් නීතියක විධිවිධාන වලට යටත්ව අරමුදලේ නමින් මණ්ඩලයට තිබිය යුතු ය. මණ්ඩලයේ බලතල, කාර්ය සහ කටයුතු.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත දක්වෙන බලතල සහ කටයුතු ක්‍රියාවේ යෙදවීම සහ ඉටුකිරීම කළ හැකිය :—

(අ) දේශීය හෝ විදේශීය මාර්ගවලින් අරමුදල් රැස්කිරීම හෝ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම ;

(ආ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය සතුවන්නාවූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගැනීම හෝ දැරීම සහ අරමුදලේ රීති වලට යටත්ව, එම දේපළ විකිණීම, ප්‍රදානය කිරීම, සමර්පනය කිරීම, විස්ථාවරණය කිරීම, පැවරීම, හුවමාරු කිරීම, උකස් කිරීම, බද්දපනය කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) හින්දු ආගම හා සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් හෝ වෙන යම් කටයුත්තක් ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

1*—ඒ 084391—(85/06)

(ඇ) ආගමික හා සංස්කෘතික තරඟ පැවැත්වීම සහ යම් හින්දු සංගමයකට, එහි යම් සාමාජිකයකුට හෝ එවැනි යම් තරඟයකට සහභාගිවන වෙන යම් තැනැත්තකුට ත්‍යාග, සහතික පත්‍ර සහ වෙනත් පිළිගැනීමේ ආකෘති ප්‍රදානය කිරීම ;

(ඉ) මණ්ඩලයේ බලතල, කටයුතු සහ කාර්ය ක්‍රියාවේ යෙදවීමේ, ඉටුකිරීමේ සහ කිරීමෙහි හා අරමුදලේ පරමාර්ථ ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා අවශ්‍ය සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වලට කෙළින්ම හෝ නිලධරයන් හා සේවකයන් හෝ මණ්ඩලය විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද අනුයෝජිතයන් මගින් හෝ ඇතුළත්වීම හෝ ඒවා ඉටුකිරීම ;

(ඊ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් ආකාරයකට අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම ;

(උ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අරමුදලේ නිලධරයන් සහ සේවකයින් පත්කිරීම, සේවයෙහි නියුක්ත කරවීම සහ ඔවුන්ට පාරිශ්‍රමික දීමනා ගෙවීම සහ එහි සේවා නියුක්තයන් පත්කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ රීති සෑදීම සහ ඔවුන්ට නිවාඩු සහ වෙනත් ප්‍රතිලාභ දීම ;

(ඌ) අරමුදලේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ කරුණුවලට අදාළ රීති සෑදීම සහ අරමුදලේ පරමාර්ථ මුදුන් පමුණුවාලීම සඳහා අවශ්‍ය යයි හෝ හේතු විය හැකි යයි මණ්ඩලය සලකන වෙනත් යම් ක්‍රියා හෝ දේවල් කිරීම.

**අරමුදලට කරනු ලබන ගෙවීම.**

7. අරමුදලට පහත සඳහන් ගෙවීම් කරනු ලැබිය යුතුය :—

(අ) 6 (2) වන වගන්තිය යටතේ රුස්කරන ලද්ද වූ යම් අරමුදල් හෝ ලැබුණා වූ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග හෝ ලබා ගන්නා වූ හෝ එකතු කරන ලද්ද වූ මුදල් ;

(ආ) අරමුදලේ අරමුණු හා පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කලින් කල රජයෙන් ලැබුණු යම් ප්‍රදානයක් ; සහ

(ඇ) අරමුදලට ආයෝජන හෝ වෙනත් ලැබීම්වලින් අයවිය යුතු යම් ආදායමක්.

**අරමුදලින් කරනු ලබන ගෙවීම.**

8. අරමුදලින් පහත දැක්වෙන ගෙවීම් කරනු ලැබිය යුතුය :—

(අ) අරමුදලේ ක්‍රියාකාරිත්වය, පිහිටුවීම සහ නඩත්තුව සඳහා අවශ්‍ය වියදම් ;

(ආ) නිලධරයන්ට, සේවකයින්ට සහ වෙනත් සේවා නියුක්තයින්ට වැටුප් ගෙවීම ; සහ

(ඇ) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍යවන, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්.

**අරමුදලේ මුදල් වර්ෂය.**

9. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

**ගිණුම් සහ විගණනය.**

10. (1) මණ්ඩලය විසින්, අරමුදලේ ආදායම සහ වියදම, සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසියාකාර ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(2) මණ්ඩලය විසින් එහි පොත් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට තුලනය කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, ඊළඟ මාර්තු මස තිස් එක් වන දිනට පෙර ආදායම් සහ වියදම් ගිණුමක් සහ පළමු සඳහන් දින දක්වා සාදන ලද අරමුදලේ වත්කම් සහ බැරකම් පිළිබඳ සාරාංශයක් ඇතුළත් ශේෂ පත්‍රයක් ද පිළියෙල කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) ආදායම් සහ වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය, මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින් අත්සන් කිරීමට බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව, සෑම වර්ෂයකම මණ්ඩලයේ ගිණුම් විගණකාධිපති විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ වැඩ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුම ඉදිරියේ තැබිය යුතු බව.

11. මණ්ඩලයේ වැඩ පිළිබඳ වාර්තාවක්, මණ්ඩලය විසින් වාර්ෂිකව පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තාව අදාළ වන්නේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත්වීමට පෙර, එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

රීති සෑදීම සඳහා මණ්ඩලය සතු බලය.

12. (1) රීති සෑදිය යුතු යයි මේ පනතින් බලය පවරන ලද හෝ නියම කරන ලද සියලු කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ මණ්ඩලය විසින් සාදන ලද කිසිම රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු බලාත්මක නොවන්නේ ය.

අරමුදලේ මුද්‍රාව.

13. අරමුදලේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තන් භාරයේ තැබිය යුතුය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය ; තවද

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව සහ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඒ දෙදෙනා පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

14. මණ්ඩලයේ බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම පිළිබඳ සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

මණ්ඩලයේ සාමාජිකයන් සහ අරමුදලේ නිලධරයන් ආදීන් මේ පනත යටතේ නඩු පැවරීමෙන් ආරක්ෂා කිරීම.

**15.** (1) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, මේ පනතේ කාර්ය සඳහා පත්කරන ලද මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ අරමුදලේ යම් නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අරමුදල විසින් හෝ අරමුදලට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදල විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදලට ගෙවනු ලබන හෝ අරමුදල විසින් ලබන යම් ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් එවැනි යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය විසින් තීරණය කරන්නේ නම්, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් එවැනි වියදමක් අයකර ගන්නේ නම් මිස අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට හෝ අරමුදලේ නිලධරයකු ආදීනට හෝ ඔහුගේ දේ පළට හෝ විරුද්ධව පිට ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**16.** අරමුදලට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ අරමුදලේ යම් නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ පිට ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

**17.** දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල සහ කාර්ය සඳහා අරමුදලේ සියලුම නිලධරයන් සහ සේවකයින් රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.

**18.** අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් අදාළ කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.